රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 24/92

මගේ අංකය: 1/36/2/2/ (ජී) 89-90
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේ දී ය.
1992 ජූනි මස 18 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිසාපතිවරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,

**සාමාන්‍ය ලිපිකාර සේවයේ I වෙනි පන්තියට උසස් කිරීම - 1990**

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වෙනි පන්තියේ 1990.12.31 වෙනි දිනට ඇති පුරප්පාඩු සා.ලි.සේ. ව්‍යවස්ථාවට අනුකූලව සා.ලි.සේ. II 'අ' ඛණ්ඩයේ දැනට සිටින සුදුසු නිලධාරීන් උසස් කිරීමෙන් පිරවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

02. උසස් කරනු ලැබීම සඳහා නිලධාරීන්ගේ යෝග්‍යතාව තක්සේරු කරනු පිණිස 1974.06.30 දින හෝ ඊට පෙර, කලින් පැවති වි.ලි.ප. II ශ්‍රේණියට උසස් කරනු ලැබ ඇත්තා වූ ද, 1974.06.30 දිනට සා.ලිසේ. II 'අ' ඛණ්ඩයේ සිටින්නා වූ ද සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් විශේෂ වාර්තා ලබාගැනීමට අවශ්‍ය වී තිබේ.

03. (I) මෙම විශේෂ වාර්තා මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ යුතුය. ආකෘති පත්‍රයේ I වෙනි කොටස අදාල නිලධාරියා විසින් ම සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට භාර දිය යුතුවේ. **දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් II කොටස නිසි පරිදි සම්පූර්ණ කොට පෞද්ගලිකවම සහතික කළ යුතුය.**

(II) නිසි පරිදි සම්පූර්ණ කර සහතික කරන ලද විශේෂ වාර්තා 1992.07.31 වැනි දිනට ප්‍රථම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

(III) සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා තාවකාලිකව මුදාහැර ඇති සුදුසුකම් ලත් නිලධාරීන් ස්වකීය වාර්තා නිසි පරිදි සම්පූර්ණ කර අදාල ප්‍රධානීන්ට භාරදිය යුතුවේ. එම ප්‍රධානීන් විසින් වාර්තාවන්හි II කොටස පෞද්ගලිකවම සහතික කිරීමෙන් අනතුරුව වාර්තා අදාල බලධාරීන් මගින් 1992.07.31 දිනට ප්‍රථම ලැබෙන සේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

04. ඒකාබද්ධ සේවා අංශයට ලැබෙන සෑම විශේෂ වාර්තාවක්ම ලැබුණු බව දන්වනු ඇත. 1992.08.30 වෙනි දිනට ප්‍රථම තම වාර්තා ලද බවට දැනුම් දීමක් නොලබන නිලධාරීන් නොපමාව ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත දන්වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

05. මේ අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සියළුම නිලධාරීන් තම තමන්ගේ අයදුම් පත් නියමිත දිනට පෙර ඉදිරිපත් කළයුතු වන අතර, 1992.07.31 දිනට පසු ඉදිරිපත් කෙරෙන අයදුම්පත් ගැන කටයුතු කරනු නොලබන බව කරුණාවෙන් සළකන්න.

06. මෙම චක්‍රලේඛ ලිපියේ අන්තර්ගත කරුණු ඔබේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේත් ඔබේ අමාත්‍යාංශ යටතේ ඇති සංස්ථාවල හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල නියතු අදල නිලධාරීන්ගේත් අවධානයට ලක් කරනු මැනවි.

අ.ක./: එම්.එන්.ජුනයිඩ්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

(ඩබ්ලිව්.පී.එස්.ජයවර්ධන),
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ.

**සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියට**
**උසස් කිරීම - 1990**

(I වැනි කොටස නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.)

---

01. මුලකුරු සමග නිලධාරියාගේ නම :-

(අ) මුලකුරුවලින් හැඳින්වෙන නම :-
(ආ) මුල් පත්වීමේ දී භාවිතා කළ නම :-

---

02. උපන් දිනය :- ස්ථිර පදිංචි ලිපිනය :-

---

03. (අ) සා.ලි.සේවයේ කලින් පැවති විධායක ලිපිකරු පංතියේ II ශ්‍රේණියට / සා.ලි.සේ. II 'අ' ඛණ්ඩයට පත් වූ දිනය :-

(ආ) 1990.12.31 දිනට වාර්ෂික ( ඒකාබද්ධ ) වැටුප හා එම වැටුපට එළඹි දිනය :-

---

04. ජ්‍යෙෂ්ඨත්ව ලැයිස්තුවේ නිලධාරියාට දී ඇති අංකය (ඇත්නම්) :-

---

05. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව :-

(අ) එහි සේවා කාලය :-
(ආ) කාර්යාලයීය ලිපිනය :-

---

06. I. සා.ලි.සේ. ව්‍යවස්ථාවේ 15 වැනි ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඔබ සම්පූර්ණ කර තිබේ ද?

II. එසේ නම්, එය සම්පූර්ණ කරන ලද දිනය :-

III. ඒ බව දැක්වෙන ගැසට් පත්‍රයේ අංකය හා දිනය :-

IV. විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටි නම් අදාල විස්තර :-

නැතහොත්,

V. ඔබ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් මුදහැර ඇත්නම් එය ක්‍රියාත්මක වූ දිනය හා යොමු අංකය :-

---

07. 1990.12.31 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුල :

1. සියලුම වැටුප් වර්ධක ඔබ විසින් උපයාගෙන තිබේද
11. ඔබ මොනයම් ආකාරයක හෝ දඩුවමක් / දඩුවම් (අවවාද කිරීම් හැර) ලබා ඇත්නම්, ඒ පිළිබඳ කෙටි විස්තරයක් සඳහන් කරන්න :-
111. ඔබට විරුද්ධව අරඹන ලද විනය කටයුතු ඇත්නම් ඒවායේ වත්මන් තත්වය (යොමු අංකය හා දිනය සහිතව සඳහන් කරන්න.) :-

---

08. සංස්ථාවක හෝවෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා ඔබ දැනට මුදහැර සිටී නම් ඒ පිළිබඳ විස්තර දන්වන්න :-

---

............................................................වන මා විසින්ම ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, දැන දැනම සැලකිය යුතු කිසිවක් සඟවා නැති බවත්, සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් සා.ලි.සේ. 1 උසස්වීම් පිළිබඳ මගේ හිමිකම නොසලකා හැරීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට ද හැකි බව මම දනිමි.

දිනය:- නිලධාරියාගේ අත්සන

---

<u>II කොටස</u>

<u>අමාත්‍යාංශ ලේකම්/පළාත් සභාලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.</u>
<u>(නොගැලපෙන වචන කපා හරින්න)</u>

I. මගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සා.ලි.සේ. II 'අ' බණ්ඩයේ ලිපිකරු / ලිපිකාරිණී .............................................................................මහතා/ මිය/ මෙනවිය විසින් සපයා ඇති ඉහත සඳහන් ප්‍රකාශයේ විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිරවද්‍ය බවට මා පෞද්ගලිකවම සෑහීමට පත්වන බවත්,

II ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්,

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියට උසස්වීමක් ලැබීමට ඔහු/ඇය සෑම අයුරින්ම සුදුසු/නුසුදුසු බවට මම නිර්දේශ කරමි.

අමාත්‍යාංශයේ ලේකම්/පළාත් සභා ලේකම්/
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
දෙපාර්තමේන්තුව/මණ්ඩලය/සංස්ථාව

දිනය :- පදවි නාමය :-
නිල මුද්‍රාව :-